සන්නස

සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියානි මද්දුමගේ
එන්ඩි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs
සාමන්ත නැන්නගේ Saamantha Tennege
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සම්බන්ධීකරණය

NSW Lakshman Kodituwakku 02 9626 7660 / 02 9837 5055
WA Kapila Hemantha Balage 08 9456 1972
QLD Ananda Samaratunga 07 3372 7953
ACT Asoka Nimalasiri 0400 429 031
SA Chandra Eeriyagama 08 8332 3216
TAS Anura Seneviratne 03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයන්ගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සලකන්න.

"වැඩිහිටියන්ට පමණයි"

රජුන් වටා එහෙයියන් සිටීම සාමාන්‍ය දෙයකි. රජු ගන්නා හොඳ තීරණයට සේම තරක තීරණයටද මේ එහෙයියෝ "එහෙයි" කියති. එහෙයියන් රජුන් අන්දවිතේන් එසේ ය.
එක්තරා කාලයක සිටි රජෙකුට වටිනා ඇඳුමක් දන්වතවා යයි කියා තිබූ ඇඳුමද ගලවා දමුවේ එහෙයියන් ය. තමන් වටිනා ඇඳුමක් ඇඳ සිටින්නේ යයි මහත් අභිමානයෙන් තිරුවසින් වීදි සංචාරය කරමින් සිටි රජතුමා දක "අපේ රජ්ජුරුවන් වහන්සේ හෙළුවැල්ලෙන්" යයි කියන්නට ශක්තිය තිබුණේ කුඩා කොලු ගැටයෙකුටයි.
මේ සියල්ල ලියන්නට සිතුණේ අද රට යමින් තිබෙන පැත්ත දක අතිවුණ සංවේගයට ය. අද මහින්ද වැරදි යයි කියන්නට තරම් ශක්තියක් ඇත්තකු බෙහෙතකටවත් සොයා ගන්නට නැත. සියල්ලෝම එහෙයියෝ ය.
ලංකා ඉතිහාසයේ කවර පාලකයකුටවත් නොලැබුණ ස්වර්ණමය අවස්ථාවක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ලැබුණි. අවශ්‍ය නම් රට කණපිට හරවා බින්දැවේ සිට නැවත ගොඩ තැගන්නට තරම් වරමක් සහ බලයක් ඔහුට ලැබී ඇත. මේ අවස්ථාව තිසි ලෙස වටහා නොගැනීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ අද මහින්ද කරමින් සිටින්නේ එක් එක් එහෙයියන් විසින් දෙනු ලබන ලණු ගෙඩි පිටින් ගිල ගැනීම බව සිදුවෙමින් පවතින ක්‍රියාවලිය පෙන්නුම් කරයි. අත්තවාදීන් පිනවීම සඳහා කරන මේ සිල්ලර වැඩ වලින් රටට වන යහපතක් තම් නැත.
රට හදන්නට අවංක අරමුණක් ඇත්නම් ඔහු එය ආරම්භ කළ යුතුව තිබුණේ ඇමති මණ්ඩලයේ සිට ය. තනතුරේ සෙවණැල්ලට මුවා වී ජඩ කම් සහ දූෂණ කරන ඇමතියන් ගේ සිට ය. රක්ෂාකාරයන් පිරාවරාගෙන ජඩකම් කරන මහජන මුදල් ලක්ෂ කෝටි ගණනින් හොරකම් කරන ඇමතියන්ට එල්ල වන චෝදනා දෙස නැසූ කන් ව බලා සිටින මහින්ද පුරවැසියන් පමණක් මෙල්ල කරන්නට සැරසෙයි. ඒ වෙනුවෙන් මහජන නිදහස සීමාවන නීතිරීති කිසිදු ලෝබ කමකින් හොරව ගෙන එන්නටද ඔහු උත්සාහ කරමින් සිටියි. තහනම් නීති වොත් ගණනින් ජනතාව මත පටවා රට යහ මඟට ගත හැකි යයි මහින්ද සිතන්නේ නම් ඒ තරම් මුලාවක් තවත් නැත.

සිංහල බෞද්ධ තලේබාත් රාජයක් වෙනුවෙන් සිහින මවන අත්තවාදීන්ට යට නොවී සිටින්ට මහින්දට ශක්තිය ලැබෙන්නේ නම් එය රටටම වාසනාව වනු ඇත. එසේ නොවේ නම් මේ අමන කම් වෙනුවෙන් දිනෙක වන්දි ගෙවන්නට සිදුවන්නේ මහින්දට පමණක් නොවේ සමස්ත ජනතාවටම ය.

ගුවන් විදුලියේ මුල්ම කණ්ඩායමෙන් තාම ඉන්නේ අපි තුන්දෙනා විතරයි - ඇස් පියසේන

ජගත් රණතුංග

"ගුවන් විදුලියේ මුල්ම කණ්ඩායමෙන් තාම ඉන්නේ අපි තුන්දෙනා විතරයි කොළඹින් කතා කරමි, කියලා රේඩියෝවෙන් ඇහෙන කාලේ තමයි මා මුලින්ම රේඩියෝවට සම්බන්ධ වුණේ. ඒ 1951. සිංහල නිබන්ධකයෙක් විදියටයි මා ආවේ. මාත් එක්ක තවත් නිබන්ධකයන් දෙදෙනෙක් සම්බන්ධ වුණා. ඉංග්‍රීසි අංශයට මාර්ක් බර්තෝලමියුස් (අකාලයේ නැසීගිය රමණි බර්තලෝමියුස්ගේ පියා) මහතාත් දෙමළ අංශයට තුන්මුගලිංගම් කියන මහතාත්. තුන්මුගලිංගම් මහතා දැනට ජීවතුන් අතර ඉන්නවාද නැද්ද දන්නෙ නැහැ. ඒත් බර්තෝලමියුස් මහතා නම් දැනට ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර වාසය කරනවා."

1951 දී නිවේදකයෙක්

ලංකාවේ ගුවන් විදුලි වංශ කතාව පිළිබඳ දැන උගත් කාට වුවත් අසේ. පියසේන යන නාමය මඟ හැරෙන්නේ නැත. නිබන්ධ සම්පාදකයෙකු ලෙස ගුවන් විදුලියට 1951 දී සම්බන්ධ වුවත් ඔහුට ඒ කාලේ හැටියට නිවේදකයෙකු ලෙසත් වැඩසටහන් නිශ්පාදකවරයෙකු ලෙසත් වගකීම් පැවරුණා. අද මෙන් ගුවන් විදුලි ශිල්පීන් බහුල නැති ඒ කාලයේ පියසේන මහතා ගුවන් විදුලියට දුලබ ශිල්පියෙක් විය.

87 හැවිරිදි අසේ. පියසේන මහතා රේඩියෝවට පමණක් නොව, ලේඛන මාධ්‍යයේ දී ප්‍රාමාණිකයෙකි. සිය අතීත දිවි සැරිය නිවි සැනසේ දිගැලී කරන ගමන් රේඩියෝව ගැන විශේෂ සැමරුම් මතුවීමට හේතු වන්නේ මුල් වරට ලංකාවේ විද්‍යුත් මාධ්‍යයේ ශිල්පියෙකු ඉන්දීය 'ආකාශවාණී' ගුවන් විදුලියේ (සමස්ථ ඉන්දීය ගුවන් විදුලිය) වසර එකොළහක් ම සේවය

ඇත්තටම අද වෙලා තියෙන්නෙ කවුරුත් අති පණ්ඩිතයන් බවට පත්වෙලා. නිවේදකයාගේ තොල් අතර ඇත්තේ සංවර නාද බසක් නෙමෙයි. සුලබ වීම අතර ඇත්තේ එකිනෙකා අතර තරගයක්. තරගය දිනීම මිස ඉටු වියයුතු සන්නිවේදන මෙහෙවර ඉබේම අහෝසි වී තිබෙනවා.

කරමින් සිංහල වැඩසටහන් ඉදිරිපත් කිරීමේ ගෞරවයට ද හිමිකම් කියන බැවිනි.

දැනට ඕස්ට්‍රේලියාවේ ජීවත් වන ඇස්. පියසේන මහතා මාස කිහිපයකට පෙර තම මව්බිමට පැමිණියේ ගම්බිම් දැක බලා, එගම වැසියන්, හඳ හිතවතුන් හා සමකාලීනයන් මුණගැසී ජීවිතයේ සැදෑ සමයේ යම් ආස්වාදයක් විඳ ගැනීමේ අදහසිනි. ඊටත් වඩා ඔහුගේ ප්‍රියතම විෂය වූ දේශපාලන අසුරේ හිඳ ලංකාවේ පුවත්පත් හරහා යම් මෙහෙවරක් ඉටු කිරීමය.

එතෙර පරතරයක්

නිබන්ධකයෙක් විදියට රේඩියෝවට එකතු වුණත් පසු කාලයේදී රාජ්‍ය තාන්ත්‍රික වශයෙනුත් ශ්‍රන්ථ කරන කටයුතුවලත් මා නියැලුණා. ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණාට පස්සත් මා එතේ 'පහන හා සන්නස' නම් සඟරාවලින් පාඨක ලෝකය හා සබඳතා පවත්වනවා. පියසේන මහතාගේ මාරක කතා රේඩියෝවෙන් අසන එකල අසන්නා ඒවා විඳගන්නේ කුතුහලය මුසු හැඟීමෙන්. අදත් ඒ අතීතය සමරණ අසන්නෝ අප අතර සිටිති.

"ලංකාවේ රේඩියෝවේ කාර්ය මණ්ඩලයට එකතු වෙලා නාට්‍ය, විචිත්‍රාංග, බොහෝමයක් කළා. ඩී. ඇම්. කොළඹගේ, තේවිස් ගුරුගේ, සිංහල අංශයෙත් ඉංග්‍රීසි අංශයේ ලිඛිත විජේමාන්නත්, ඊරංගෝන් යන මහත්වරුත්, දෙමළ අංශයේ සිවපාත සුන්දරම් සහ එලායස් නම් කාන්තාවත් සමග මුල් කාලයේ අප වැඩ කළා. ඊළඟට කරුණාරත්න අබේසේකර, එච්. එම්. ගුණසේකර, ප්‍රනා පෙරේරා, සිරිසෝම ජයසිංහ වගේ අය මුණ ගැසුණා."
පියසේන මහතා සිය සමකාලීන ගුවන් විදුලි පුරෝගාමී ශිල්පීන් බොහෝම දෙනෙකු පිළිබඳ සළලාපයේ යෙදෙන්නේ කාතාවේදීත්වය මෙන්ම ඔවුන්ගේ දක්ෂම් හා අපූරු හැකියාවන් ද අගයමිනි.
ප්‍රතිසංස්කරණයෙන් පස්සෙ ශ්‍රී ලංකාවෙ රේඩියෝවට ගිය මා එහි සේවය කළේ වසර දොකක් වැනි කාලයක්. ඉන් පස්සෙ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙ මුල්ම සිංහල පරිවර්තක ලෙස කටයුතු කිරීමේ භාග්‍ය හිමි වුණා.

පාර්ලිමේන්තු කතා

භාෂාවක් තවත් භාෂාවකට පරිවර්තනය කිරීමේ කටයුත්ත පහසු යැයි කෙනෙකුට පෙනී ගියත් පාර්ලිමේන්තු සභා ගැබේ කෙරෙන මන්ත්‍රී කතාවක් ඉංග්‍රීසි බසට එසැනින් පෙරැළීම කොතරම් අභියෝගයක් වන්නට ඇත්ද ?
එහෙත් ඒ අභියෝගය නොපැකිළිව බාරගත් පියසේන මහතා සිය ඉදිරි දිවි සැරිය තව තවත් මුවහත් කරගත්තේය. පසු කාලීනව ඔහු ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් ලෙස පත්වන්නේද ඒ රටේ සමාජ ආර්ථික හා දේශපාලනය පිළිබඳ පුළුල් අවබෝධය නිසාය. ඉන්දියාවේ 1965 අපුරුදද්දෙ ආකාශවාණී සේවයට ගිනිං අපුරුදු 11කට පස්සෙ ලංකාවට ඇවිත් ඊට පස්සෙ ඉන්දියාවට යන්නේ 83දී. ඒ අර නියෝජ්‍ය කොමසාරිස් හැටියට."

පළමු ගුණ සමරුව

පුරෝගාමී ගුවන් විදුලි ශිල්පියෙකු ලෙස සිය මතකය අවදි කරන පියසේන මහතා සමග එකට වැඩ කළ සමකාලීනයන් අදත් ජීවතුන් අතර සිටින්නේ කවුරුන්දැයි විමසන්න අමතක කළේ නැත.
එදා රේඩියෝවෙ මාත් එක්ක වැඩසටහන් ඉදිරිපත් කළ ප්‍රනා

37 වන පිටට



ඉන්දියාවේ නිවපු නියෝජ්‍ය මහ කොමසාරිස්
එස්. පියසේන